# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2292/32 - 2022 අගෝස්තු මස 09 වැනි අඟහරුවාදා - 2022.08.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත**

**14 වැනි වගන්තිය යටතේ නියෝගය**

1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(2) වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, 2020 නොවැම්බර් 17 දිනැති අංක 2202/6 දරන *අති විශෙෂ ගැසට් නිවේදනයේ* ඇමුණුම - ඒ යටතේ, මෙම නියෝගය මගින් 2022 අගෝස්තු 10 වැනි දින සිට නව (xx) ඡේදය ඇතුළත් කරමින් එකී ප්‍රකාශිත නියෝගය තවදුරටත් සංශෝධනය කරමි.

(xx) සහනදායි පියවර වශයෙන් ලබාදීමට හෝ අත්‍යාවශ්‍ය මහජන සේවා අඛණ්ඩව පවත්වා ගැනීමට පහසුකම් සැලසීම සඳහා ව්‍යාපාරික ආයතන, ස්වෙච්ඡා සංවිධාන හා හිතෛෂීන් ද ඇතුළුව යම් විදේශ රාජ්‍යයන් (රජයන්), සංවිධාන වෙතින් යම් රාජ්‍ය ආයතනවලට, රජය මගින් අනුමත ආයතනවලට හා යම් රාජ්‍ය ආයතන සමඟ සෘජු සහයෝගීතාවයෙන් සහන ක්‍රියාකාරකම්වල නියුක්ත ආයතනවලට ආධාර/ පරිත්‍යාග වශයෙන් ලැබීමට නියමිත අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයන පහත කරුණුවලට යටත් වනු ලැබේ ;

(අ) පරිත්‍යාග සහ සහන පියවර සමඟ සම්බන්ධිත රාජ්‍ය ආයතනය හෝ රජය විසින් අනුමත ආයතනය හෝ සෘජුව සම්බන්ධීකරණ කටයුතු කරන රජයේ ආයතන භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ (ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා) නිර්දේශය. එකී එක් එක් අවස්ථාව මත පදනම්ව ; (i) අදාළ පරිත්‍යාගය ලබා දීමෙන් අපේක්ෂිත කාර්යය හා ඉලක්කගත ප්‍රතිලාභීන් පිළිබඳව තමා විසින් සෑහීමකට පත්වීමෙන් අනතුරුව පමණක් ලේකම්වරයා විසින් සෙස් බද්ද ඉවත් කිරීම සඳහා සිය නිර්දේශය ලබා දිය යුතු ය ; සහ (ii) එකී නිර්දේශ ලිපිය නිකුත් කරන ලේකම්වරයා (ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා) වෙත එසේ පරිත්‍යාග කරන භාණ්ඩ භාරදිය යුතු ය.

(ආ) යථෝක්ත (අ) හි සඳහන් නිර්දේශය ලැබීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සියලු පරිත්‍යාග අනුමත කළ යුතු ය ;

(ඇ) අපේක්ෂිත කාර්යය (කාර්යයන්) සඳහා හා ප්‍රතිලාභීන් වෙත නොමිලේ ලබා දීම සඳහා එවැනි භාණ්ඩ ලබාදීම හෝ බෙදා හැරීම සිදුවන තෙක් යථොක්ත (අ) හි සඳහන් ලේකම් (ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා) විසින් මෙම කාර්ය පරිපාටිය යටතේ ආධාර/පරිත්‍යාග වශයෙන් ලැබෙන භාණ්ඩ සඳහා වගකීම හා වගවීම දැරිය යුතු වේ ; සහ

(ඈ) භාණ්ඩාගාර ලේකම්වරයාගේ පූර්ව අනුමැතියක් ලබා ගැනීමෙන් තොරව මෙම කාර්ය පරිපාටිය යටතේ ආධාර/පරිත්‍යාග වශයෙන් ලැබෙන භාණ්ඩ ඉහත සඳහන් කෙරෙන කාර්යය හැර වෙනත් කාර්යයන් වෙනුවෙන් විකිණීම, බැහැර කිරීම හෝ භාවිතා කිරීම සිදුකළ නොහැකි වේ. මෙම කාර්යය පරිපාටිය උල්ලංඝනය වන අවස්ථාවක දී, අදාළ බදු අයකර ගැනීම සඳහා ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් රේගු ආඥාපනතේ විධිවිධාන යටතේ ක්‍රියාමාර්ග ගත යුතු වේ.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායිකරණ
සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2022 අගෝස්තු මස 09 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

EOG 08 - 0110

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.